**ජාතික යොවුන් සේනාංකය - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

---

### 1.1 තත්ත්වාගණනය කල මතය

---

ජාතික යොවුන් සේනාංකයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ජාතික යොවුන් සේනාංකයේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සේනාංකය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සේනාංකය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සේනාංකයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සේනාංකයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සේනාංකයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

----------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සේනාංකයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සේනාංකයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සේනාංකයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සේනාංකය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය කළ යුතුය. නමුත් 2021 දෙසැම්බර් 31 දිනට පැවති රු. මිලියන 410.2 ක් වටිනා වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර භාවිතයේ පැවතුනද මෙම වත්කම්වල ඵලදායි ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුව නැවත සමාලෝචනය කර ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති බැවින්, නැවත ප්‍රත්‍යාගණනය කර 2022 වසරේ ගිණුම් තැබීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී ඉදිකිරීම් වැඩ අවසන් කර තිබුණු රු. මිලියන 744.5 ක් පිරිවැය වූ පුහුණු මධ්‍යස්ථාන 08 ක් දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කරනු වෙනුවට 2021 දෙසැම්බර් 31 දින වන විටත් කෙරීගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රාග්ධනිත කර ඉදිරිපත් කිරීමට කටයුතු සිදුකර ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී ඉදිකිරීම් වැඩ අවසන් කර තිබුණු පුහුණු මධ්‍යස්ථාන 31 ක ගොඩනැගිලි වැඩිදියුණු කිරීම් සඳහා වැය කරන ලද රු. මිලියන 29 ක් සහ පුහුණු මධ්‍යස්ථාන 11 ක ගොඩනැගිලි ඒකක 18 ක් ඉදිකිරීම සඳහා වැයකරන ලද රු. මිලියන 243 ක් ප්‍රාග්ධනිත කිරීමකින් තොරව | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

කෙරීගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

## 1.6 ලැබිය යුතු සහ ගෙවියයුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ලැබිය යුතු දෑ වල දක්වා ඇති සේනාංකයෙන් පරිබාහිර ආයතනයක් වූ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය විසින් 2015 සිට 2021 දක්වා පරිහරණය කරන ලද විදුලි හා ජල පරිභෝජනයට අදාළව හා වරිපනම් වෙනුවෙන් අයවිය යුතු රු. මිලියන 14 ක් සහ වෙන්නප්පුව පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් අදාළ ඉදිකිරීම් ආයතනයට වැඩිපුර ගෙවා තිබූ රු. මිලියන 2ක් 2022 සැප්තැම්බර් 15 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2015 සිට 2020 දක්වා කාලය සඳහා කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය වෙතින් අයකර ගත යුතු රු.13,144,155 ක මුදල වාර්ෂික ගිණුම් වලින් කපා හැරිම සඳහා යොවුන් සේනාංක සභා අනුමැතිය ලැබි ඇති අතර 2022 වර්ෂයේ ගිණුම් හි අදාල ගැලපිම් සිදු කිරීමට කටයුතු කරමි. වෙන්නප්පුව මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් ඉදිකිරීම් ආයතනයට වැඩිපුර ගෙවන ලද මුදල අයකර ගැනීමට කටයුතු සිදු කරමින් පවති. | සේනාංකය වෙත ලැබිය යුතු අයවීම් අප්‍රමාදව ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2. ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසරකට වඩා වැඩි කාලයක සිට පැවත එන වෙනත් ගෙවිය යුතු දෑ යටතේ දක්වා ඇති බැහැරගත පුහුණු වෙනුවෙන් ගෙවිය යුතු රු. මිලියන 1ක් සහ වසර තුනකට වඩා වැඩි කාලයක සිට පැවත එන 2021 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති රු. මිලියන 1.4 ක් 2022 සැප්තැම්බර් 20 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | බැහැරගත පුහුණු වෙනුවෙන් ගෙවිය යුතු රු.මිලියන 1 ක 2022 වර්ෂයේ පොත්වලින් කපා හැරීම් සිදුකර ඇති අතර රු.මිලියන 1.4 ක් වන උපචිත වියදම් ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. | ගෙවිය යුතු මුදල් අප්‍රමාදව නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |

### 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම් ගිවිසුම් අවලංගු කරන ලද | මෙම ඉදිකිරීම් ගිවිසුම් අවලංගු කරන ලද පුහුණු මධ්‍යස්ථාන වල | ඉදිකිරීම් අත්තිකාරම් අප්‍රමාදව නිරවුල් කරවා |

| | | |
|---|---|---|
| පුහුණු මධ්‍යස්ථාන 04 ක් හා මූලික වැඩ ප්‍රමාණපත් වල අඩුපාඩු පැවතීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු නවතා ඇති ගෝමරන්කඩවල පුහුණු මධ්‍යස්ථානයේ පෙරසවි ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ලබා දී තිබුණු එකතුව රු. මිලියන 62.6 ක් වූ ඉදිකිරීම් අත්තිකාරම් මේ වන තෙක් නිරවුල් කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සහ පෙරසවි ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ලබා දී ඇති ඉදිකිරීම් අත්තිකාරම් ඉදිරියේදී නිරවුල් කරවා ගැනීමට කටයුතු කරනු ඇත. | ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු අතර ගිණුම් ශේෂ පොත්වලින් කපා හැරීම නිසි ක්‍රමවේදයන් යටතේ සිදු කල යුතුය. |
| (ආ) 2016 අගෝස්තු 09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ජාතික උපකරණ හා යන්ත්‍රෝපකරණ සංවිධානය වෙත ජාතික යොවුන් සේනාංකයේ නව මධ්‍යස්ථාන 10 ක් හා පවතින මධ්‍යස්ථානවල ගොඩනැගිලි ඒකක 21 ක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත් විවෘත ටෙන්ඩර් ක්‍රියාවලියෙන් බැහැරව ලබා දී තිබුණි. ඉදිකිරීම් ප්‍රගතියේ අසාර්ථකත්වය හේතුවෙන් 2020 ජනවාරි 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත් අවලංගු කිරීමට තීරණය කර තිබුණි. එසේ වුවත් ජාතික යොවුන් සේනාංකය විසින් එම සංවිධානය වෙත 2016 හා 2017 වර්ෂ වලදී ලබාදී තිබුණු රු. මිලියන 109.2 ක් වූ මුළු අත්තිකාරම් මුදලින් රු. මිලියන 37.6ක් මෙම ඉදිකිරීම් කටයුතු අවලංගු කර වසර දෙකක් ගත වී තිබියදීත් නිරවුල් කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ජාතික උපකරණ හා යන්ත්‍රෝපකරණ සංවිධානය වෙත ලබා දී තිබූ අත්තිකාරම් වලින් තවදුරටත් නිරවුල් කළ යුතු රු.37,615,680 ක අත්තිකාරම් මුදල අවසන් බිල්පත් නිරවුල් කිරීමේදී නිරවුල් කරවා ගැනීමට කටයුතු කරනු ඇත. | කොන්ත්‍රාත් පරිපාලනය විධිමත්ව අයුරින් සිදු කළ යුතු අතර අය කළ යුතු අත්තිකාරම් මුදල අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| **(i)** 5.1 ඡේදය | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාර සේනාංකය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ජාතික යොවුන් සේනාංකයේ 2023-2027 සඳහා වූ ආයතනික සැලැස්මෙහි කෙටුම්පත සකස් කරන විට එහි සංස්කරණ කටයුතු සඳහා මේවන විට විශේෂඥ | සේනාංකයේ සංයුක්ත සැලැස්ම පිළියෙල කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | උපදේශකවරයෙකු වෙත යොමුකර ඇති බව සඳහන් කරමි. | |
| **(ii)** 6.5.1 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු නමුත් මාස 09 ක් ප්‍රමාද වී මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි. | 2022 වර්ෂයේ ගිණුම් සකස් කරන විට නිශ්චිත කාල සීමාව තුල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | ව්‍යවස්ථාපිත අවශ්‍යතා අනුව මූල්‍ය ප්‍රකාශන අප්‍රමාදව පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | සේනාංකය විසින් 2021 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු. මිලියන 2,378 ක් වූ දේපල පිරියත හා උපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | 2022 වර්ෂයේදී ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනයෙන් පසුව ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කර යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. | ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2022 අංක 21 දරන යොවුන් සේනාංක පනතේ 2. (4) වගන්තිය | සභාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෘත්තීය පුහුණුව, යොවුන් සංවර්ධනය සහ ස්ථාපනය යන කාර්ය සඳහා කමිටු 3 ක් පත් කරනු ලැබිය යුතු වන අතර සභාව විසින් ස්වකීය බලතල ඒ කමිටුවලට පවරනු ලැබිය හැකි බව සඳහන් කර තිබුණ ද ජාතික යොවුන් සේනාංකය විසින් සේනාංකය ආරම්භ කළ 2002 වර්ෂයේ සිට එපරිදි කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ජාතික යොවුන් සේනාංක සභාවේ අනුමැතිය අනුව ක්‍රියාකාරි ලෙස කමිටු පත්කිරීමට කටයුතු කරනු ලැබේ. | යොවුන් සේනාංක පනත අනුව සභාවේ කටයුතු සඳහා කමිටු පත්කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 17 අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 28.7 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 11.7 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වර්ෂයේ ආදායම රු. මිලියන 37 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)ජාතික යොවුන් සේනාංකයේ ප්‍රධාන කාර්යාලයේ භාවිතා වන ලියාපදිංචි අයිතිය වෙනත් අමාත්‍යාංශ හා ආයතන සතු වටිනාකම රු. මිලියන 31.5ක් වූ වාහන 08 ක් මෙතෙක් සේනාංකය නමින් පවරාගෙන නොතිබුණි. | ජාතික යොවුන් සේනාංකය භාවිතා කරන වාහනවල ලියාපදිංචි අයිතිය ලබා ගැනීම සඳහා අදාල කටයුතු සිදු කරමින් පවතින අතර ඒවායේ සීඝ්‍ර ප්‍රගතියක් නොමැති වුවත් ඒ ඒ අවශ්‍යතාවයන් අනුව ඉදිරි ක්‍රියාමාර්ග සිදුකරමින් පවතී. | සේනාංකයේ අරමුණු ඉටුකරලීම සඳහා වත්කම් කළමනාකරණය කාර්යක්ෂම ලෙස සිදු කළ යුතුය. |
| (ආ) 2021 දෙසැම්බර් 31 දිනට පුහුණු මධ්‍යස්ථාන ස්ථාපිත කර ඇති සහ සේනාංකයට පවරාගත හැකි ඉඩම් 62 ක් අතරින් ඉඩම් 19 ක් පමණක් සේනාංකයට පවරාගෙන තිබුණු අතර ඉතිරි ඉඩම් 43 හි පවරා ගැනීම් කටයුතු මෙතෙක් නිම වී නොතිබුණි. | සේනාංකය වෙත තවදුරටත් පවරාගත යුතු ඉඩම් 43 හි පවරා ගැනිමේ කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. මෙම ඉඩම් 43 න් ඉඩම් 17 ක් අදාල පවරා ගැනිමේ කටයුතුවල අවසාන අදියරේ පවතී. | සේනාංකයේ අරමුණු ඉටුකරලීම සඳහා වත්කම් කළමනාකරණය කාර්යක්ෂම ලෙස සිදු කළ යුතුය. |
| (ඇ) 2017 වර්ෂයේ දී වැඩ ආරම්භ කරන ලද 2021 දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම් ගිවිසුම් අවලංගු කරන ලද කෙරීගෙන යන වැඩ තුළ ඇතුළත් රු. මිලියන 20ක් වූ පුහුණු මධ්‍යස්ථාන 02 ක් සහ රු. මිලියන 3.7ක් වූ ගෝමරන්කඩවල පෙරසව් ගොඩනැගිල්ලෙහි ඉතිරි ඉදිකිරීම් කටයුතු 2022 ඔක්තෝබර් 31 දින තෙක් නැවත ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිකිරීම් ගිවිසුම් අවලංගු කර ඇති කොටපොල පුහුණු මධ්‍යස්ථානය අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය පරිදි වෘත්තිය පුහුණු අධිකාරිය වෙත භාරදීමට කටයුතු කරනු ඇත. කල්පිටිය පුහුණු මධ්‍යස්ථානයේ අවලංගු කරන විට අදාළ කොන්ත්‍රාත් ආයතනයේ බැංකුව වෙත තබා තිබූ කාර්ය සාධන හා අත්තිකාරම් ඇපකරයන්හි මුදල් ජාතික යොවුන් සේනාංකයට අයකර ගන්නා ලදී. ගෝමරන්කඩවල පෙරසව් ගොඩනැගිල්ලෙහි ඉතිරි ඉදිකිරීම් කටයුතු ඉදිරියේදී ලැබෙන ප්‍රතිපාදන අනුව සිදු කිරීමට කටයුතු කරනු ඇත. | පුහුණු මධ්‍යස්ථානවල ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) 2011 දෙසැම්බර් 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රටේ තරුණ ප්‍රජාව බල ගැන්වීමේ කාර්යය වඩාත් හොඳින් හා ඵලදායිව ඉටු කිරීම සඳහා ඊට ගැළපෙන පරිදි පවතින යොවුන් සේනාංක පනත පරිවර්ජනය කර නව පනතක් සම්මත කර ගත යුතු වුවද ඒ සඳහා වසර 11 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ වන විට වර්තමාන ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයාගේ මූලිකත්වයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත අදාල කෙටුම්පත අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව නව පනතක් සම්මත කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) 2002 අංක 21 දරන යොවුන් සේනාංක පනතේ 18 වන වගන්තිය යටතේ සාදන ලද 2003 ඔක්තෝබර් 10 දිනැති නියෝගවල 4 | ජාතික යොවුන් සේනාංකයේ මූලික පාඨමාලාව හදාරා වෘත්තිය පුහුණුවට යොමු නොවීමට අදාල හේතුන් ලෙස | පුහුණුලාභීන්ට වෘත්තිය සුදුසුකම් ලබාගත හැකිවන පරිදි |

| | | |
|---|---|---|
| (ii) ප්‍රකාරව සේනාංකය විසින් ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොළ ඉලක්ක කර විවිධ ක්ෂේත්‍ර වල පවතින ජාතික වෘත්තීය සුදුසුකම් පුහුණුලාභීන්ට ලබාගත හැකි පාඨමාලා රජයේ වෘත්තීය පුහුණු ආයතන හා ඒකාබද්ධව සකස් කර පුහුණුලාභීන් යොමු කිරීමට කටයුතු කර නොතිබුණි. | පුහුණුලාභීන් උසස් අධ්‍යාපනයට යොමු වීම, රැකියාගත වීම, ස්වයං රැකියා හෝ ව්‍යාපාර කටයුතු සඳහා යොමු වීම, විදේශ ගත වීම ආදි හේතූන් දැක්විය හැක. අපේක්ෂිත සිසුන් ප්‍රමාණයක් වෘත්තිය පුහුණුව සඳහ යොමු කර ගැනීමට නොහැකි වීමේ මූලික ගැටළුව ලෙස කොවිඩ් 19 වසංගත රෝග තත්ත්වය මූලික ලෙස බලපාන ලදි. සංචරණ සීමා පැනවීම, ප්‍රවාහන ගැටළු හා වාත්තිය පුහුණු ආයතනවල පාඨමාලා ආරම්භ කිරීම අපේක්ෂි කාල පර්ච්ඡේදයන්හි සිදු නොවීම වෘත්තිය පුහුණුවට අපේක්ෂිත ලෙස යොමු නොවීමට හේතු විය. | පාඨමාලා සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) සේනාංකය විසින් පෞද්ගලික ආයතන 66 ක පාඨමාලා 132 ක් හා රජයේ වෘත්තිය පාඨමාලා 20 ක් හැදෑරීම සඳහා පමණක් වෘත්තීය පුහුණුව ලබාදීමට පුහුණුලාභීන් යොමු කර තිබුණි. ඒ සඳහා එක් පුහුණුලාභියෙක් සඳහා රු. 100,000 ක උපරිම පුහුණු ගාස්තුවක් නියමකර තිබුනද පිරිවැය රු.100,000 ත් රු. 800,000 ත් අතර පරාසයේ පාඨමාලා පුහුණුලාභීන් විසින් හදාරා තිබුණි. තවද වෘත්තිය පාඨමලාවලට යොමු කරන පුහුණුලාභින් පාඨමලාව අවසන් කර රැකියා ගත වනතුරු අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක්ද සේනාංකය විසින් සකස් කර නොතිබුණි. | පාඨමාලා හදාරනු ලබන සිසු සිසුවියන් සඳහා ගෙවීම් සිදු කිරීමේදී පාඨමාලාව අවසන් වන තෙක් පසු විපරම් සිදු කරනු ලබන අතර ඉදිරියේදී රැකියා ගත වීම සම්බන්ධයෙන්ද සිදු කළ යුතු පසු විපරම් සඳහා මේ වන විට තොරතුරු රැස් කිරීම උදෙසා පසු විපරම් පත්‍රිකාවක් සකස් කරමින් පවතී. මේ සම්බන්ධව විශේෂ අවධානය යොමු කර එවැනි ගැටළු නිවැත සිදු නොවීමට වගබලා ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි. | වෘත්තිය පාඨමාලා අවසන් කරන පුහුණුලාභීන් රැකියාගත වනතෙක් අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |